**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම් දිස්ත්‍රික්කය**
------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මැයි 19 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 20 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු තෙල් ඉසින යන්ත්‍රයේ වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ජල බදු ආදායම් රු. 95,150 ක් ජ'නල් 55 මගින් සමුච්චිත අරමුදලට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ජල බදු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) කර්මාන්ත අංශයේ 2015 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය වූ රු.6,037 ක් වූ ඉංජිනේරු ගල් හා 8" x 24" හියුම් පයිප්ප වටිනාකම රු. 127,540 ක් ඉතිරි තොග ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) 2013 හා 2014 වර්ෂ සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු රු.71,160 ක මුදල රු.100,000 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඉ) 2005 වර්ෂයට අදාල මූලධන ආධාර රු.1,033,173 ක් එම වර්ෂයේ ආදායම් වියදම් ගිණුමට බැර කර තිබියදී නැවත සමාලෝචිත වර්ෂයේදී ජ'නල් සටහන් 29 මගින් සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.
----------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ රු.99,969 ක් වටිනාකමැති අයිතම 02 කට අදාලව විස්තරාත්මක උපලේඛන නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරික්ෂා කිරීමට නොහැකි විය.

#### 1.3.3 නීති රීති, රෙගුලාසි හා විධි විධානවලට අනුකූල නොවීම්
------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දක්වා ඇත.

**නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම**

| | |
|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ. 571 | වටිනාකම රු. 776,086 ක් වූ කල් ඉකුත් වූ තැන්පත් ආදායමට ගැනීමට හෝ අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 396 | නිකුත් කරන ලද එහෙත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ රු.21,892 ක වටිනා චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් ගැලපීම් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,855,078 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,873,960 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුල පිළිවෙලින් රු.73,023,133 ක් හා රු.15,189,115 ක්වූ මූලධන ආධාර හා රු.73,805,319 ක් හා රු.16,210,883 ක්වූ මූලධන වියදම් ගණන් ගැනීමෙන් පසු එකී අතිරික්තය පිළිවෙලින් රු.1,072,892 ක් හා රු.3,852,192 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵල වල රු. 2,779,300 ක පිරිහීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ). සමාලෝචිත වර්ෂයේදී සභාවේ මුළු මෙහෙයුම් අයභාරය රුපියල් මිලියන 48 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ මුළු මෙහෙයුම් අයභාරය රුපියල් මිලියන 41 ක් හා සසඳන විට රුපියල් මිලියන 07 ක වැඩි වීමකි.

(ආ). සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වියදම රුපියල් මිලියන 46 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ වියදම වූ රුපියල් මිලියන 36 හා සැසඳීමේදී රුපියල් මිලියන 10 ක වැඩි වීමකි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායම රුපියල් මිලියන 73 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධන ආදායම වූ රුපියල් මිලියන 15 හා සැසඳීමේදී රුපියල් මිලියන 58 ක වැඩිවීමකි.සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 74 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයට වඩා වැඩි වී තිබුනේ රුපියල් මිලියන 58 කිනි.

(ඈ). ඉහත තත්ත්වයන් හේතු කොටගෙන වර්ෂය සඳහා වන අතිරික්තය රුපියල් මිලියන 01 ක් වී ඇති අතර,එය ඉකුත් වර්ෂයේ අතිරික්තය වූ රුපියල් මිලියන 04 හා සැසඳීමේදී රුපියල් මිලියන 03 ක මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමක් විය.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත අදායම්, තත්‍ය අදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු ඉකුත් වසර හා සසඳා පහත දැක්වේ.

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | අයවැයගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට හිඟය | අයවැයගත | තත්‍ය | දෙසැම්බර්31 දිනට හිඟය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 2,749 | 2,852 | 9,550 | 2,924 | 1,712 | 10,702 |
| බදු කුලී | 2,545 | 2,319 | 6,876 | 2,532 | 1,636 | 6,317 |
| වෙළඳ බලපත්‍ර | 775 | 1,195 | -- | 975 | 1,002 | -- |
| වෙනත් ආදායම් | 42,606 | 37,123 | 29,516 | 35,176 | 28,087 | 28,496 |

## 2.3.2 බිල් කල ආදායමෙන් රැස්කළ ආදායම

**සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ආදායම් රැස් කිරීම හා හිඟහිටි ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ**

| ආදායම් ශීර්ෂය | ආදායම් බිල් කිරීම | | | ආදායම් රැස් කිරීම | | | | හිඟ හිටි ආදායම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015-01-01 දිනට හිඟය | 2015 වර්ෂයේ බිල් කිරීම | එකතුව | 2015.12.31 දක්වා හිඟයෙන් රැස් කළ මුදල | බිල් කිරීමෙන් රැස් කල මුදල | ඉදිරි වර්ෂ සඳහා ලැබු මුදල | එකතුව | 2015.01.01 දිනට පැවති හිඟයෙන් ඉතිරි මුදල | බිල්කල ආදායමින් හිඟහිටි | 2015.12.31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 9,314,227 | 2,674,248 | 11,988,475 | 1,788,963 | 1,017,650 | 45,543 | 2,852,156 | 7,525,263 | 1,656,598 | 9,181,860 |
| අක්කර බදු | 387,954 | 37,879 | 425,833 | 51,722 | 5,233 | 483 | 57,438 | 336,232 | 32,645 | 368,877 |
| ජල බදු | 626,696 | 250,700 | 877,396 | 282,666 | 90,700 | 1,800 | 375,166 | 344,030 | 160,000 | 504,030 |
| කඩ කුලී | 548,540 | 237,850 | 786,390 | 172,650 | 37,640 | 10 | 210,300 | 375,890 | 200,209 | 576,099 |
| බදු කුලී | 5,639,620 | 2,265,025 | 7,904,645 | 656,189 | 1,452,351 | | 2,108,540 | 4,983,431 | 812,673 | 5,796,104 |

### 2.3.3 වරිපනම් බදු

-------------

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල් කළ වරිපනම් බදු මුදල වූ රු. 2,674,248 ක් වර්ෂය තුළදී රැස් කරගෙන තිබුනේ 1,017,650 ක මුදලක් පමණි. එය බිල් කළ මුදලින් සියයට 38 ක ප්‍රමාණයකි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාවේ සමස්ථ වරිපනම් බදු හිඟය රු.9,181,861 ක් වූ බැවින් අදාළ කාල වකවානු තුළදී ආදායම් රැස් කිරීම පිළිබඳ ප්‍රගතිය දුර්වල තත්වයක් විය.

(ඇ) සභා බල ප්‍රදේශයේ වරිපනම් හා අක්කර බදු නොගෙවා පැහැර හරින තැනැත්තන්ට අයත් චංචල දේපල තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ158 වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

### 2.3.4 මුද්දර ගාස්තු

-------------

පළාත් සභාව විසින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකර ගෙන තිබූ මුද්දර ගාස්තුවලින් 2015 දෙසැම්බර් 31 දිනට සභාවට අය විය යුතුව තිබූ මුද්දර ගාස්තුවල වටිනාකම රු. 22,010,858 ක් විය. ඉන් රු. 9,089,676 ක මුදලක් 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය සඳහා වන අතර, වසර 05 කට වඩා පැරණි එම ශේෂ නිරවුල් නොකර තවදුරටත් පවත්වා ගැනීම සභාවේ සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය තත්ත්වය වෙනස්වීමේ ප්‍රකාශනයේ වත්කම් පාර්ශවය අනවශ්‍ය ලෙස පුළුල් කර දැක්වීමක් බව නිරීක්ෂණය විය.

### 2.3.5 උසාවි දඩ

------------

පළාතේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ උසාවි දඩ මුදල් වල වටිනාකම රු. 7,504,809 ක් විය. ඉන් රු. 1,939,309 ක් 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අදාළ උසාවි දඩ මුදල් විය.

### 2.3.6 බදු කුලී

---------

(අ) 2015 දෙසැම්බර් 31 දිනට හි බදු කුලි රු.5,979,606 වූ අතර, ඉන් 2001 වර්ෂයේ සිට 2014 වර්ෂය සඳහා හිග බදු කුලී රු.4,988,842 විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩ කුලී රු.576,100 ක් වූ අතර, එයින් රු.532,800 ක් පමණ වූ හිඟ ශේෂයෙහි හිඟ කාලය වර්ෂ 02 ත් 09 ත් අතර වන බවත් කඩ කුලී ආදායම් රැස්කිරීම දුර්වල මට්ටමක විය.

### 2.3.7 ඉඩම් විකිණීම් මත බදු

-------------------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තියේ විධිවිධාන අනුව ප්‍රාදේශීය සභාවක සීමාවන් ඇතුලත වූ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට 01 ක් සභාව විසින් අයකර ගත යුතු වුවත්, ඇස්තමේන්තු විකුණුම් මුදලින් සියයට 01 ක් පමණක් අයකර ගෙන තිබුණි.

### 2.3.8 ජල ගාස්තු

-------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු රු.270,036 ක් වූ අතර, ජල ගාස්තු අය කිරීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි.ජල ගාස්තු හිඟ කාලය අවුරුදු 01 ත් 07 ත් අතර වන ජල පාරිභෝගිකයෝ 23 ක් විය.

### 2.3.9 අක්කර බදු

-----------

සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟ අක්කර බදු රු.368,394 වූ අතර, එයින් රු.170,501 ක් පමණ වූ හිඟ ශේෂයන්හි හිඟ කාලය වර්ෂ 08 ක් ඉක්මවූ අතර අක්කර බදු ආදායම් රැස්කිරීම දුර්වල මට්ටමක විය.

**2.4 වියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාළ විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| **වියදම් විෂයය** | **අයවැයගත** | **තථ්‍ය** | **විචලනය** | **අයවැයගත** | **තථ්‍ය** | **විචලනය** |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. ,000 | රු. ,000 | රු. ,000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 35,262 | 33,438 | 1,824 | 27,310 | 22,777 | 4,533 |
| අනෙකුත් | 13,240 | 12,593 | 647 | 12,580 | 13,362 | (782) |
| උප එකතුව | 48,502 | 46,031 | 2,471 | 39,890 | 36,139 | 3,751 |
| ප්‍රාග්ධන වියදම් | 1,500 | 73,805 | (72,305) | 17,000 | 16,211 | 789 |
| මුළු එකතුව | 50,002 | 119,836 | (69,834) | 56,890 | 52,350 | 4,540 |

ඉහත සටහන අනුව සමාලෝචිත වර්ෂයේ ප්‍රග්ධන වියදම් අයවැයගත ප්‍රමාණයට වඩා මිලියන 72,305 කින් වියදම් වැඩිවී තිබුණි.

**2.5 අධිභාර**

ආරච්චිකට්ටුව සති පොල ගාස්තු එකතු කිරීමේ අයිතිය 2005 වර්ෂයට බදුදීම වෙනුවෙන් අයකර ගත යුතුව තිබූ රු.901,705 ක බදු මුදල් අයකර නොගැනීම සම්බන්ධයෙන් සභාවේ සභාපති ඇතුළු නිලධාරීන් වෙත විගණකාධිපතිවරයා විසින් 2011 මාර්තු 24 දින අධිභාර නිවේදනයක් නිකුත් කර තිබුණි.එම මුදලින් වාරික වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.113,100 ක් අයකර ගෙන තිබූ අතර, තව දුරටත් රු.788,605 ක් අයවීමට තිබුණි

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කලයුතු රු.7,265,000 ක් වටිනා ව්‍යාපෘති 18 ක් අත්හැර දමා තිබූ අතර, ව්‍යාපෘති 2 ක් සඳහා ඇස්තමේන්තු කල මුදල ඉක්මවා රු.597,219 ක් වැය කර තිබුණි.

**3.2** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| **සේවක ශ්‍රේණිය** | **අනුමත** | **තථ්‍ය** | **පුරප්පාඩු** | **අතිරික්තය** |
|---|---|---|---|---|
| තෘතීක | 01 | 01 | - | - |
| ද්විතීයික | 25 | 18 | 09 | 02 |
| ප්‍රාථමික | 52 | 56 | 04 | 08 |
| | 78 | 75 | 13 | 10 |

## 4. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමණාකරණය
(ඈ) ණය ගැති හා ණය හිමි පාලනය